**ශීර්ෂය 312 - බස්නාහිර පළාත් සභාව**

---

**1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය**

**1.1 දැක්ම**

සහජීවනය සහ තිරසාර සංවර්ධනය තුළින් බස්නාහිර පළාත පෙරට

**1.2 මෙහෙවර**

මූල්‍ය, භෞතික හා මානව සම්පත් ප්‍රශස්ථ ලෙස මෙහෙයවමින් සියළු ප්‍රජාවට සෙත සැළසෙන සාමය හා සහජීවනයෙන් පිරි තිරසාර සංවර්ධනයක් උදාකිරීම.

**1.3 කාර්යභාරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

**2. මුළු ප්‍රතිපාදනය හා වියදම**

බස්නාහිර පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 19,965.75 ක්වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 18,812.9 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 1,152.85 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5.77 ක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2019 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 17,848.75 | 17,848.75 | - | - |
| මූලධන | 2,117.00 | 964.15 | 1,152.85 | 54.45 |
| එකතුව | 19,965.75 | 18,812.90 | 1,152.85 | 5.77 |

**3. විගණන නිරීක්ෂණය**

ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනය කර තිබුණි. පළාත් සභාවේ අරමුදල විගණනය කර ඒ පිළිබඳව විගණකාධිපති වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.